සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2025 ජූලි

## (202) අංකිත (ඩිජිටල්) පරිසරයේ තොරතුරු පද්ධති

(Information Systems in Digital Environment)

2025-07-27
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
    *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*
  - (4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

## 01 වන ප්‍රශ්නය

*අංක **1.1** සිට **1.10** දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** මූල්‍ය තාක්ෂණය (FinTech) සහ විශාල දත්ත (Big Data) වැනි තාක්ෂණයන් ආයතනවලට, ඔවුන්ගේ තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා උපකාරී වන්නේ කෙසේදැයි පහත සඳහන් ඒවා අතුරෙන් තෝරන්න:

(1) නව තාක්ෂණයන් නොසලකා හැරීමෙන්.

(2) කාර්යයන් කිරීමේදී පැරණි ක්‍රමවලට ඇලී සිටීමෙන්.

(3) මූල්‍ය ගනුදෙනු කෙරෙහි පමණක් අවධානය යොමු කිරීමෙන්.

(4) ඉක්මනින්ම තීරණ ගැනීමෙන් සහ වඩා හොඳ මූල්‍ය සේවා ලබා දීමෙන්.

**1.2** ජංගම පරිගණක උපාංග, සංවිධානයක සමස්ත තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සඳහා සහාය වන්නේ සහ ශක්තිමත් කරන්නේ කෙසේදැයි පහත සඳහන් ඒවා අතුරෙන් තෝරන්න:

(1) සංවිධානයේ සම්පත්වලට දුරස්ථව ප්‍රවේශවීමේ හැකියාව සීමා කිරීමෙන්.

(2) සංවිධානයේ ඇතැම් යෙදුම් වෙත ප්‍රවේශය සීමා කිරීමෙන්.

(3) සේවකයින්ට ඕනෑම තැනක සිට සංවිධානයේ පද්ධති සහ දත්ත වෙත ප්‍රවේශවීමට ඉඩ දීම තුළින් නම්‍යශීලීභාවය සහ ඵලදායීතාවය වැඩි දියුණු කිරීමෙන්.

(4) පුද්ගලික සන්නිවේදනය සඳහා පමණක් භාවිත කිරීමෙන්.

1.3 පහත සඳහන් ඒවා අතුරෙන්, ජංගම-වාණිජ්‍යය (M-Commerce) යෙදුම් සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) ජංගම බැංකුකරණය.
(2) ජංගම අලෙවිකරණය.
(3) ජංගම ටිකට්පත් නිකුත් කිරීම.
(4) ඉහත සඳහන් සියල්ලම.

1.4 පහත සඳහන් සාධක සලකා බලන්න:

**(a)** දත්තවලට ප්‍රවේශවීමේ හැකියාව (Accessibility).

**(b)** දත්තවල ආරක්ෂාව සහ සුරක්ෂිත බව (Safety and security).

**(c)** දත්තවල සංකීර්ණත්වය (Complexity).

**(d)** ගබඩා කළ යුතු දත්තවල ප්‍රමාණය (size of data).

ඉහත සඳහන් ඒවා අතුරෙන්, දත්ත සමුදායක් (database) තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු සාධක වන්නේ:

(1) **(a)** සහ **(c)** පමණි.
(2) **(b), (c)** සහ **(d)** පමණි.
(3) **(a), (b)** සහ **(d)** පමණි.
(4) ඉහත සඳහන් සියල්ලම.

1.5 පහත සඳහන් ඒවා අතුරෙන්, "දත්ත කැනීම" (data mining) සම්බන්ධයෙන් **වැරදි** ප්‍රකාශය කුමක් ද?

(1) එය විශාල දත්ත සමූහවලින් තොරතුරු ලබා ගනියි.
(2) එය වංචා අනාවරණය කර ගැනීමට භාවිත කළ හැකිය.
(3) එය විශාල දත්ත සමූහයන් සඳහා භාවිත කළ නොහැකිය.
(4) එය දත්ත සමූහයක ප්‍රවණතා සහ රටාවන් හඳුනා ගැනීමට උදව් වේ.

1.6 පහත සඳහන් ඒවා අතුරෙන්, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ තොරතුරු පද්ධති තෝරාගැනීමේදී සලකා බැලිය යුතු සාධකයක් **නොවන්නේ** කුමක් ද?

(1) ආරක්ෂාව.
(2) සහයෝගය සහ සංවර්ධනය.
(3) ක්‍රියාකාරී නොවන බව.
(4) පිරිවැය සහ යෝග්‍යතාවය.

1.7 විද්‍යුත් වාණිජ්‍ය සමාගමකට ව්‍යාපාරයේ වත්මන් තත්ත්වය තේරුම් ගැනීම සඳහා එහි ප්‍රධාන කාර්යසාධන දර්ශක [Key Performance Indicator (KPIs)] නිරීක්ෂණය කිරීමට අවශ්‍ය වී ඇත. පහත සඳහන් ව්‍යාපාර විශ්ලේෂණ ශිල්පීය ක්‍රමවලින් මෙම අරමුණ සඳහා වඩාත් ප්‍රයෝජනවත් වන්නේ කුමන ශිල්පීය ක්‍රමය ද?

(1) නිර්දේශිත / වට්ටෝරු විශ්ලේෂණ (Prescriptive Analytics).
(2) පුරෝකතන විශ්ලේෂණ (Predictive Analytics).
(3) මෙහෙයුම් විශ්ලේෂණ (Operational Analytics).
(4) විස්තරාත්මක විශ්ලේෂණ (Descriptive Analytics).

1.8 **කසුනිගේ** කලින් සමීප මිතුරෙකු (intimate partner) වූ **අමිත්,** කසුනි ලෙස පෙනී සිටිමින් ඇයට හිරිහැර කිරීම සඳහා **කසුනිගේ** නමින් ව්‍යාජ ෆේස්බුක් ගිණුමක් සාදා, ඇයට බලවත් පීඩාවක් ඇතිකරන කටකතා සහ බොරු පතුරුවා හැරියේය. පහත සඳහන් ඒවා අතුරෙන්, **අමිත්ගේ** මෙම හැසිරීම වඩාත් හොඳින් විස්තර කරන්නේ කුමකින් ද?

(1) අනිෂ්ඨ මෘදුකාංග (Malware).
(2) සයිබර් හිරිහැර කිරීම (Cyber Bullying).
(3) තතුබෑම් (Phishing).
(4) සැසීම / හැක් කිරීම (Hacking).

1.9 පහත සඳහන් ඒවා අතුරෙන්, පුද්ගලයින් සඳහා තොරතුරු පෞද්ගලිකත්වය (Information Privacy) නිවැරදිව නිර්වචනය කරන්නේ කුමකින් ද?

(1) සමාගම්වලට, අලෙවිකරණ අරමුණු සඳහා අවශ්‍ය තරම් පරිශීලකයින්ගේ දත්ත ගබඩාකර තබාගැනීමට ඇති හැකියාව.

(2) රජයට, ජාතික ආරක්ෂක අරමුණු සඳහා දත්ත අධීක්ෂණය කිරීමට ඇති අයිතිය.

(3) පුද්ගලයෙකුට ඔහුගේ හෝ ඇයගේ දත්ත පාලනය කිරීමට සහ එම දත්ත එක් රැස්කරන, භාවිත කරන සහ බෙදාහරින ආකාරය නියම කිරීමට ඇති අයිතියයි.

(4) යාවත්කාලීන කිරීම සඳහා උපාංගවල තොරතුරු වෙත ප්‍රවේශවීමට මෘදුකාංග සංවර්ධකයින්ට ලබා දී ඇති අවසරය.

1.10 පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලාංකීය වෙළෙඳපොළට හඳුන්වා දුන් බාධාකාරී තාක්ෂණයන් (disruptive technologies) නිසා ඇති වූ නවෝත්පාදනයකට උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) මුහුණට මුහුණ බැංකුකරණය (Face-to-face banking).

(2) මුද්‍රණ යන්ත්‍ර සහ ස්කෑනර් යන්ත්‍ර වැනි දෘඩාංග උපාංග (hardware devices).

(3) මයික්‍රොසොෆ්ට් ඔෆිස් (Microsoft Office) 365 වැනි ඵලදායිතා යෙදුමක්.

(4) PickMe වැනි Ride-hailing යෙදුම් සහ සංචලතා විසඳුම් (mobility solutions).

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 20)

*අංක 1.11 සිට 1.15 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.11 ආයතනය තුළ සේවකයින් අතර සන්නිවේදනය සිදුකිරීමට අන්තර්ජාල ප්‍රොටොකෝලය හරහා හඬ [Voice over internet protocol (VOIP)] භාවිත කළ හැකිය.

1.12 ශ්‍රී ලංකාවේ පුද්ගලයින් විසින් අන්තර්ජාල සම්බන්ධතාවය සඳහා පොදුවේ භාවිත කරන වේගවත් ක්‍රමවලින් එකක් වන්නේ චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ අන්තර්ජාල සම්බන්ධතාවයයි [Internet over Satellite (IoS)].

1.13 ගනුදෙනු සැකසුම් පද්ධතිවලට [Transaction Processing Systems (TPS)] දත්ත සැකසිය හැක්කේ කාණ්ඩ ලෙස (batches) පමණි.

1.14 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනත යටතේ කෙනෙකුට ලබාදී ඇති අධිකාරී සීමාවන්ගෙන් පිටත අරමුණු සඳහා පරිගණකයක් භාවිත කිරීම, දඬුවම් ලැබිය හැකි වරදක් ලෙස සැලකේ.

1.15 මූල්‍ය තාක්ෂණයන් (Financial Technologies) මගින් තත්‍ය කාලීන දත්ත සහ විශ්ලේෂණ වෙත ප්‍රවේශය සීමා කරමින් සංවිධානයකට දැනුවත් මූල්‍ය තීරණ (informed financial decisions) ගැනීමේ හැකියාව අඩු කරයි.

(එකකට ලකුණු 01 බැගින්, ලකුණු 05)

(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

### 02 වන ප්‍රශ්නය

වර්තමාන ඩිජිටල්කරණය වී ඇති ලෝකයේ, දත්ත සඵලදායී ලෙස කළමනාකරණය කිරීමට, උපායමාර්ගික තීරණ ගැනීමට සහ තරඟකාරී වාසි පවත්වා ගැනීමට, සංවිධාන තොරතුරු පද්ධති මත දැඩි ලෙස රඳා පවතී. මේ සඳහා, දත්ත සහ තොරතුරු අතිශය වැදගත් භූමිකාවක් ඉටුකරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) දත්ත සහ තොරතුරු අතර ඇති වෙනස්කම් දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) නූතන සංවිධානවල දැනුවත් තීරණ ගැනීමට (informed decision-making) සහය වීම සඳහා දත්ත විශ්ලේෂණය කිරීමේදී, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මෙවලම් (ICT tools) සහය වන ආකාර දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රති-ඉංජිනේරුකරණය [Business Process Re-engineering (BRR)] යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

වර්ධනය වෙමින් පවතින සැපයුම් සමාගමක් වන, **"SwiftMove"**, සිය මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා එහි ජංගම උපාංග සහ මෘදුකාංග වැඩිදියුණු කිරීම (upgrade) පිළිබඳව සලකා බලමින් සිටී. ආයතනයේ වැඩිවන දත්ත අවශ්‍යතා සපුරාලීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට සහ නැව්ගත තොග නිරීක්ෂණය කිරීමට සුදුසු දත්ත සමුදායක් තෝරාගැනීම සඳහා **SwiftMove** වලාකුළු ගබඩාකරන (cloud storage) විකල්ප ඇගයීමට ලක් කරමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **SwiftMove** හට භාවිත කළ හැකි පොදු කාර්ය මෘදුකාංග (general purpose software) දෙකක්(02) සහ යෙදුම් සුවිශේෂී (application specific) මෘදුකාංග දෙකක්(02) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 04)

(b) **SwiftMove** ට සිය ජංගම උපාංග (mobile devices) වැඩිදියුණු කිරීම අවශ්‍ය වීමට හේතු දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) වලාකුළු පරිගණකගතකරණයේ (cloud computing) අවාසි දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 10)

### 04 වන ප්‍රශ්නය

උපදේශන ආයතනයක් වන **"DataDriven Solutions"**, ව්‍යාපාර බුද්ධිය [Business Intelligence (BI)] සහ විශ්ලේෂණ වේදිකා (analytics platforms) ඇතුළු විවිධ තොරතුරු පද්ධති ක්‍රියාත්මක කිරීමට සංවිධානවලට සහාය දක්වයි. මෙම ආයතනය දැනට විශාල නිෂ්පාදන සමාගමක නව තොරතුරු පද්ධති ඒකාබද්ධ කිරීමට සහ උපාය මාර්ගික තීරණ ගැනීම සඳහා දත්ත උපයෝගී කර ගැනීමට සහාය දක්වමින් සිටියි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) දත්ත විශ්ලේෂණය සහ ව්‍යාපාර බුද්ධිය අතර වෙනස **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) කාර්යාල ස්වයංකරණ පද්ධතියක් [Office Automation System (OAS)] භාවිත කිරීමේ වාසි තුනක්(03) **හඳුනා දක්වන්න.** (ලකුණු 03)

(c) ව්‍යාපාර බුද්ධි වැඩසටහනක (business intelligence program) ප්‍රතිලාභ හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

සමාජමාධ්‍ය, සන්නිවේදනය සහ ව්‍යාපාරික ක්ෂේත්‍රයන් (landscapes) නැවත හැඩගැස්වීම අඛණ්ඩව සිදු කරයි. සංවිධාන සහ පුද්ගලයින්, තොරතුරු පද්ධති හා සම්බන්ධ අවස්ථා, තර්ජන සහ නීතිමය ප්‍රතිවිපාක අවබෝධ කර ගැනීම අවශ්‍ය වේ. ඒ සමඟම පාරිසරික වශයෙන් වගකිව යුතු පරිගණකගතකරණයේ අවශ්‍යතාවය අන් කවරදාටත් වඩා තීරණාත්මක වී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සමාජ මාධ්‍ය සහ සමාජ ජාලවල සෘණාත්මක බලපෑම් තුනක්(03) **හඳුනා දක්වන්න.** (ලකුණු 03)

(b) පහත සඳහන් තොරතුරු ආරක්ෂණ සංකල්ප (මූලධර්ම) **පැහැදිලි කරන්න:**

(i) අඛණ්ඩතාවය (Integrity).

(ii) ලබාගත හැකි බව (Availability). (ලකුණු 03)

(c) දත්ත මධ්‍යස්ථානවලට (data centers) මෙන්ම ඩෙස්ක්ටොප් (desktop) පරිගණකවලට, හරිත පරිගණකගතකරණය (green computing) සඳහා අනුගත වීමේදී බලපාන සාධක දෙකක්(02) **පැහැදිලි කරන්න.**

(ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**"Innovate Lanka"** යනු හතරවන කාර්මික විප්ලව ($4^{th}$ Industrial Revolution) තාක්ෂණයන් සහ මූල්‍ය තාක්ෂණ (FinTech) විසඳුම්, ශ්‍රී ලාංකික වෙළෙඳපොළට ගෙන ඒම කෙරෙහි අවධානය යොමුකර ඇති ආරම්භක අවධියේ පවතින තාක්ෂණික (tech startup) සමාගමකි. ඔවුන්, දේශීය ව්‍යාපාර සහ පුද්ගලයින් දියුණුවන තාක්ෂණයන්ගෙන් සවිබල ගැන්වීම සඳහා කෘත්‍රිම බුද්ධිය භාවිත යෙදුම් (AI-driven applications) සහ ගුටක දාම පාදක වේදිකා (blockchain-based platforms) සංවර්ධනය කරමින් සිටිති.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **"Innovate Lanka"** විසින් සංවර්ධනය කරන ලද, කෘත්‍රිම බුද්ධිය භාවිත යෙදුම් (AI-driven applications) වැනි දියුණු වන තාක්ෂණයන් අනුගමනය කිරීම මගින් ශ්‍රී ලාංකික ව්‍යාපාරවලට තරඟකාරී වාසි ලබාගත හැකි ආකාර දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) සමූහ අරමුදල් (crowd funding) භාවිත කිරීමේ වාසි හතරක්(04) **හඳුනා දක්වන්න.** (ලකුණු 04)

(c) සමූහ අරමුදල් ආශ්‍රිතව විය හැකි අවදානම් දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 25)

### 07 වන ප්‍රශ්නය

ශ්‍රී ලංකාව තුළ වර්ධනය වෙමින් පවතින කාබනික ආහාර බෙදාහැරීමේ නිරත **Greenway** ආයතනය, එහි වේගවත් ව්‍යාප්තියෙන් පසු අභියෝග කිහිපයකට මුහුණ දෙමින් සිටී. තත්‍යකාලීන ඇණවුම් කළමනාකරණය (real-time order management), මාර්ගෝපදේශනය (navigation) සහ පාරිභෝගික ප්‍රතිචාර (customers' feedbacks) සඳහා ආයතනයේ බෙදාහැරීමේ නියෝජිතයින් ජංගම උපාංග භාවිත කරති. නිරන්තරයෙන් වැඩිවන ඇණවුම් පරිමාව නිසා **Greenway** වඩා හොඳ විස්තාරණ හැකියාවක් (scalability) සඳහා වලාකුළු ගබඩා යොදාගැනීමට සහ තොග පාලනය (inventory) හා පාරිභෝගික තොරතුරු කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සඳහා ශක්තිමත් දත්ත සමුදායක් පිළිබඳව සළකා බලමින් සිටී. සමාජ මාධ්‍ය වේදිකා භාවිත කරමින් සෞඛ්‍යය ගැන සැලකිලිමත් වන පාරිභෝගිකයින් රැසක් වෙත ළඟාවීමට ඔවුන්ගේ අලෙවිකරණ උපායමාර්ග වැඩිදියුණු කිරීමට **Greenway** සැළසුම් කරයි.

දත්තවල ආරක්ෂාව සහ පාරිභෝගිකයින්ගේ පෞද්ගලිකත්වය (privacy) මෙම ව්‍යාපාරයේ තීරණාත්මක සළකා බැලිය යුතු කරුණු වේ. එබැවින්, සංවේදී දත්ත ආරක්ෂා කිරීමට සහ ශ්‍රී ලංකාවේ නීති රෙගුලාසිවලට අනුකූලවීමට **Greenway** විසින් ශක්තිමත් ආරක්ෂක මිනුම් ක්‍රියාත්මක කළ යුතුව ඇත. තොග හිඟයට සහ බෙදාහැරීමේ ප්‍රමාදයන්ට තුඩුදෙන තොග නොගැළපීම් පිළිබඳ මෑත කාලීන ගැටළු හේතුවෙන් ව්‍යාපාර බුද්ධිය (business intelligence) සහ විශ්ලේෂණ මෙවලම් (analytics tools) භාවිත කිරීමේ අවශ්‍යතාවය මතුව තිබේ. තොග ප්‍රශස්තව පවත්වා ගැනීමට, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට සහ දත්ත මත පදනම් වූ තීරණ ගැනීමට, තත්කාලීන උපකරණ පුවරු (real-time dashboards) සහ පුරෝකතන විශ්ලේෂණ (predictive analytics) භාවිත කිරීමටද **Greenway** අදහස් කරයි.

නීතිමය අවශ්‍යතාවලට අනුකූලවීමේ වැදගත්කමද ඔවුන් හඳුනාගෙන ඇත. පක්ෂපාතීත්ව වැඩසටහනක් (loyalty program) හරහා පාරිභෝගික තෘප්තිය වැඩිදියුණු කිරීම, සේවක දත්ත සඵලදායි ලෙස කළමනාකරණය කිරීම සහ දියුණු වන තාක්ෂණයන් අනුගමනය කිරීමෙන් සහ නියාමන අනුකූලතාව (regulatory compliance) සහතික කිරීමෙන් පරිනාමය වෙමින් පවතින වෙළෙඳපොළ තුළ තරඟකාරී වාසි පවත්වාගෙන යාම **Greenway** හි අරමුණයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **Greenway** හට භාවිත කළ හැකි ජංගම උපාංග (mobile devices) හතරක්(04) **ලැයිස්තුගත කරන්න**.(ලකුණු 04)

(b) ආයතනයේ සියළුම සේවකයින් සඳහා සන්නිවේදන මෘදුකාංග හඳුන්වා දීමෙන් **Greenway** හට ලබාගත හැකි ප්‍රතිලාභ හතරක්(04) **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(c) කාර්යාල ස්වයංක්‍රියකරණ පද්ධති (Office Automation Systems) හැර **Greenway** හට භාවිත කළ හැකි වෙනත් තොරතුරු පද්ධති වර්ග තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(d) **Greenway** හට විද්‍යුත් වාණිජ්‍යය (E-Commerce) භාවිත කිරීමෙන් ලබාගත හැකි වාසි පහක්(05) **සඳහන් කරන්න**. (ලකුණු 05)

(e) **Greenway** හි තොරතුරු පද්ධතිවලට හිතාමතා හෝ අනිෂ්ඨ ලෙස (malicious) පහරදිය හැකි, තොරතුරු ආරක්ෂණ තර්ජන දෙකක්(02) **හඳුනාගෙන** ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා ගතහැකි පියවර දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

## කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |